# කාන්තා හිංසනය වැලැක්වීමේ අන්තර්ජාතික දින 16 ට සමගාමීව අමාත්‍යාංශයේ අංශ අතර පවත්වනු ලබන විවාද තරගාවලිය

කාන්තාවන්ට එරෙහි සියළු ආකාරයේ හිංසන වැලැක්වීම සඳහා වන එක්සත් ජාතීන්ගේ දින 16 වැඩසටහනට සමගාමීව පවත්වන වැඩසටහන් මාලාවේ එක් වැඩසටහනක් ලෙස අමාත්‍යාංශයේ අංශ අතර විවාද තරගාවලියක් පැවැත්වීමට ජාතික කාන්තා කමිටුව අදහස් කර ඇත.

අන්තර්ජාතික දින 16 පිළිබඳ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ දැනුවත්භාවය ඇති කිරීම හා නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් නොවැම්බර් මාසයේදී අදියර 02 ක් යටතේ මෙම විවිද තරඟාවලිය පැවැත්වේ.

## පළමු වටය සඳහා යෝජිත මාතෘකා

- ගෘහස්ත හිංසනය නීති මගින් පමණක් අවම කල හැක/නොහැක
- කාන්තා හිංසනයන් සිදු වන්නේ කාන්තාවන්ගේ ද දායකත්වය ඇතිව/ නැතිව
- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනය ශ්‍රී ලංකාවේ අවම කල හැක/නොහැක
- පොදු ප්‍රවාහන සේවය තුල සිදු වන කාන්තා හිංසනය වැළැක්විය හැක/ වැළැක්විය නොහැක
- වර්තමාන සේවා ස්ථාන තුල කාන්තා හිංසනය සිදු වේ/නොවේ
- සයිබර් අපරාධ වැලැක්වීමට තාක්ෂණික සහය අත්‍යාවශ්‍ය වේ/ අත්‍යාවශ්‍ය නොවේ

## අවසාන වටය සඳහා යෝජිත මාතෘකාව

- ලිංගික අල්ලස් ලබා දෙන්නේ කාන්තාවන් ගේ කැමැත්තෙන් ද? අකමැත්තෙන් ද?

**ස්ථානය -** මුල් ළමා විය සංවර්ධන ව්‍යාපෘති ශ්‍රවණාගාරය

## තරඟාවලිය පවත්වන ආකාරය

නොවැම්බර් මාසයේ පළමු සතිය තුලදී එක් එක් අංශ අතර පළමු වටයේ තරඟාවලිය පවත්වා ඒ අතුරින් ජයග්‍රහණය කරන කණ්ඩායම් දෙක අතර අවසන් වටයේ තරඟාවලිය දින 16 වැඩසටහන යටතේ සිදු කරන ආරම්භක වැඩසටහනේදී පැවැත්වීමට තීරණය කර ඇත.